KIDS GOD WORSHIP
www.kidworship.kr

# යේසුස්වහන්සේ පුංචි දරුවන්ට ආදරෙයි

–Jesus loves the little children–



17Page

**පොතේ ගුරා** දවසක්දා යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් සමඟින් දේවරාජ්‍යය ගැන දේශනා කරන්නට යුදෙව් ගමකට ගියා. යේසුස්වහන්සේ යන සෑමතැන-කම බොහෝ සෙයින් සෙනග රැස්වුණා. දෙමව්පියන්, වැඩිහිටියන් වගේම ඔවුන් සමග ආව දරුවන්ද බොහෝ සිටියා.

**පළමු දෙමව්පිය** ඔන්න... දැන් යේසුස්වහන්සේ අපේ ගමටත් ආවා...

**දෙවන දෙමාපිය** දරුවා... අපි යමු යමු... යේසුස්වහන්සේට කතා කරන්නත්, උන්වහන්සේගේ ආශීර්වාදවලට සවන් දෙන්නත් අපි යමු...

**ළමයා** යේ... යේ... නියමයි...

**පොතේ ගුරා** යේසුස්වහන්සේ හමුවෙන්න යමු යි කීවාම දරුවන් ප්‍රීතියෙන් කුල්මත්ව උද්-ධාමයට පත් වුණා.

.................................................................................................



18Page

**පොතේ ගුරා** "ආහ්... අර ඉන්නේ ... අන්න.. අතන යේසුස්වහන්සේ ඉන්නවා." යි කියමින් ළමුන් උඩපැනගෙන යේසුස්වහන්සේ වෙතට දුවගෙන යනවා. එහෙත් ළමුන් යේසුස්වහන්සේට ළංවෙන්න හද්දීම, ගෝලයන් සහ දෙමව්පියන් දෙගොල්ලම දරුවන්ට අවහිර කරන්න පටන් ගත්තා.

**පළමු ගෝලයා** මේ... ඔයාලා කොහොමද මේ යේසුස්වහන්සේ උගන්වන වෙලාවේ ළමයින් ව මෙතැනට ගෙනෙන්නේ? බෑ... බෑ...

**දෙවන ගෝලයා** ළමයි ශබ්ද කරනවා... කරදර කරනවා... යේසුස්වහන්සේ ඒකට කැමති වෙන්නේ නෑ... ඔයාලා මෙතැනින් යන්න...

**ළමයා** අනේ මටත්... යේසුස්වහන්සේ බලන්න ඕනනේ...

.................................................................................................



19Page

**පොතේ ගුරා** මේ හැමදේම හොඳින් බලාගෙන සිටිය යේසුස්වහන්සේ ගෝලයන්ට තරවටු කළා. යේසුස්වහන්සේ මෙසේ කීවා.

**යේසුස්වහන්සේ** "ළදරුවන් මා වෙතට එන්නට ඉඩ දෙන්න... ඔවුන්ට කරදර නොකරන්න... දෙවියන්වහන්සේගේ රාජ්‍යය මෙවැනි අයගේය"
මාගේ ගෝලයනි, මම ඇත්තටම ඔබලාට කියන්නම්, ඔයාලත් කුඩා දරුවන් මෙන් දේවරාජ්‍යය පිළිගන්නේ නැතිනම් ඔයාලට කවදාකවත් ඊට ඇතුල්විය නොහැකි වෙනවා.

.................................................................................................



20Page

**පොතේ ගුරා** යේසුස්වහන්සේ කුඩා දරුවන්ව පිළිගත්තා, උන්වහන්සේ ඔවුන්ව වඩාගෙන ඔවුන්ට ආශීර්වාද කළා.

**පළමු ළමයා** ෂාහ්... ආනේ නියමයි... යේසුස්වහන්සේගේ රැවුල හරිම ලස්සනයි... හී හී

**දෙවන ළමයා** අනේ යේසුනි... අපිට තවත් කතන්දරයක් කියලා දෙන්නකෝ...

**යේසුස්වහන්සේ** හා... හා... හීහ්... හිහ්...

**පොතේ ගුරා** යේසුස්වහන්සේ ගිය සෑම තැනකදීම, උන්වහන්සේ විසින් එහි සිටි කුඩා දරුවන්ව පිළිගනු ලැබූවා. ඒ අය කරදරකාරයන් සේ උන්වහන්සේ සිතුවේ නෑ. උන්වහන්සේ කුඩා දරුවන්ට බොහෝ සේ ආදරය කළා.

| | |
|---|---|
| **ජීවිතයට අදාල කිරීම** | **දුවේ පුතේ, අපි කවුරුත් කැමතියි, අපිට කෙනෙක් ආදරය කරනවට නේද? යේසුස්වහන්සේගේ ආදරය. හරි පුදුමයි නේද? ඔව්! ඔයා භයවෙන්න එපා! යේසුස්වහන්සේ ඔයාටත් ගොඩක් ආදරෙයි. ආදරයක් නැතිව ඉන්න අයටත් යේසුස්වහන්සේගේ ආදරයේ කතාව අදම කියා-දෙන්න.** |